- **අම්මේ තාත්තේ , මෙම කතාව දරුවන්ට කියා දෙන්න.**

රෑ සාදය

වේයෝ හරි ම කඩිසරයි. වැඩක් නැතුව ඉන්න වෙලාවක් හොයා ගන්න අමාරුයි. හැමවෙලාවෙ ම පුංචි පුංචි පස් ගුළි අරන් ගෙයක් හදනවා. මේ ගෙදර හදන්නෙ එක්කෙනෙකුට ඉන්න ම නෙමෙයි. හැම දෙනාට ම ඉන්න යි. හැමදෙනා ම එකතුවෙලා විවේකයක් නොගෙන ම ගේ හදන්නේ වැසි කාලය අත ළඟ ම එන බව දැනගෙනයි. ඉක්මනින් ගේ හදලා අවසන් කළ යුතු නිසා වේයන්ගේ නායකයා රැස්වීමක් කැඳෙවුවා. ගේ හදන වැඩේ බෙදාගෙන කරන්න තීරණය කළා. පස් ගේන්න, බිත්ති බඳින්න, බිත්තිවල ජනෙල් දොරවල් දාන්න වැඩ බෙදා ගත්තා. වේ හාමිනේලා දොර රෙදි ජනෙල් රෙදි දමා ගේ ඇතුළ සරසන්න බාර ගත්තා. කොහොම හරි වැස්සට කලින් ගේ හදලා අවසන් කළා. ගෙදර ලොකු සාදයක් පවතවත්වන්න වේ නායකයා තීරණය කළා. දිනයක් නයි ම කරලා කූඹින්යන්ටයි. තණකොළ පෙත්තන්ටයි, කණමැදිරියන්ටයි ආරාධනා කළා. සාදය පැවැත්වුණේ රාත්‍රී කාලයේ.කූඹි සහ තණකොළ පෙත්තෝ කෑම වර්ග ගොඩක් අරගෙන සාදයට ආවා. කණමැදිරියන්සාදයට පැමිණ නොමිලේ ම ආලෝකය ලබා දුන්නා. එදා රෑ වේයන්ගෙ ගේ ඇතුළ දිව්‍ය ලෝකයක් වගේ. හැමෝම ගොඩක් සතුටු වුණා.

**තේරවිලි 05ක් තෝරාගන්න.**

1. සුදු පාටයි - උසම උසයි
   හිස දල්වයි - අඳුර නසයි

2. උස ම උසයි - බෙල්ල දිගයි
   ගස්වල දලු - හිටගෙන කයි

3. රෑ අහසේ දිලිසෙන්නේ
   ලොවට එළිය මම දෙන්නේ

4. දාරත් නැති - මුලුත් නොමැති
   යන්නේ මම පෙරළි පෙරළි

5. මගේ ඇඟේ කුරු ගොඩයි - පාට පාට මල් විසිරෙයි
   අව්වට වැස්සට දෙකටම - මාව උඩින් අරන් දුවයි

(ඉටිපන්දම) (ජිරාෆ්) ( හඳ) (බෝලය) (කුඩය)